
# පුංචි නෝරිකෝ



එච්.ජී. යුරේෂි සශිනි බිමක්ෂා රාජපක්ෂ

# පුංචි නොරිකෝ

එච්.ජී. යුරේෂි සශිනි බිමක්ෂා රාජපක්ෂ

# පුංචි නොරිකෝ


කතෘ  ප්‍රකාශනයකි

එච්.ජී. යුරේෂි සශිනි බිමක්ෂා රාජපක්ෂ
මහාමායා බාලිකා විදුහල
මහනුවර

කතෘගේ වෙනත් කෘතීන්

1. අහිංසක ලේන් පැටියා - 2019
2. සුදු පුසී - 2020
3. හිරු කුමරු යන්න ගිහින් - 2020
4. අභ්‍යවකාශ චාරිකාව - 2023

ISBN - 978 - 624 - 208 - 464 - 0



# පිදුම

මහමෙරක් තරම්
ආදරය තියාගෙන
ආදරය  නොපෙන් වූ
තාත්තාට
නොපෙන් වූ ආදරයක්
විඳ දරාගෙන
සාගරයක් තරම් ආදරයක් දුන්
අම්මාට
පුදමි මේ කෘතිය
හද බැතින්

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵළයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.


විදුහල්පතිනිය<br>
ශශිකලා සේනාධීර<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



ඈත මිටියාවතේ කඳු
අතර ලස්සන
වනාන්තරයක් තිබුණා.

කුරුල්ලන්ගේ කීච් බීච් නාද ඇසෙන සුළඟට
කොළ වැනෙන රෝස වළාකුළු කොළපාට
කඳු මුදුන්වල හැපෙන,


ලැවැන්ඩර්, බිලුබෙරි මල් සුවඳ නහයවල්
කිති කවන,කෙළවරක් නොපෙනෙන
තණකොල පිට්ටනි විහිදුනු මෙම වනාන්තරය
හරිත වර්ණයෙන් හරිම ලස්සනට ඈතට
පෙනුනා.



ඩේසි මල් ලක්ෂ ගණන් පිපුණු ලස්සන ගම්මානය මෙම වනාන්තරය කෙලවර තිබුණේ.

මේ ලස්සන ගම්මානයේ ජීවත්වුන පුංචි ගෑනු ළමයෙක් හිටියා.

එයා තමයි නොරිකෝ.



මේ පුංචි නොරිකෝ දවසම කාලය ගත කලේ වනාන්තරයේ කෙලවර ගස් දෙකක් අතර ගැටගහපු වැල් ඇඳට වෙලා.

නොරිකෝ පුංචිම පුංචි බබෙක් කාලේ ඉඳලම ජීවත් වුනේ එයාගේ නැන්දයි මාමයි එක්ක තමයි.

මේ පුංචි
නොරිකෝ හරිම අහිංසකයි. ඒ වගේම හරිම ධෛර්යවන්තයි.

නොරිකෝ පුංචි ළමයෙක් උනත් නැන්දටයි, මාමටයි වැඩ වලට ගොඩාක් උදව් කලා. එයාලාගේ ගොවිපොලේ කිකිලියෝ බලා ගත්තා. බිත්තර එකතු කලා.

බැටළුවන්ව කඳු මුදුනට අරන් ගියා. ගොවිපලේ අනිත් සතුන්ට කෑම දුන්නා. දවස පුරාම නොයෙක් වැඩ කරලා මේ දෙන්නට උදව් කලා.

ඇත්තම කීවොත් නොරිකෝ වයසට වඩා ගොඩාක් වැඩ කලා.

නොරිකෝ කවදාවත්ම තමන්ගේ ජීවිතේ ගැන දුක් වුනේ නෑ. නිතරම හරිම සන්තොසෙන් හිටපු පුංචි ළමයෙක් තමා නොරිකෝ.

එයාට ලැබුණ හැම පුංචි දේකටම ගොඩාක් ස්තුති කලා.

ගමේ හිටපු අනෙක් හැමෝමත් නොරිකෝට ගොඩාක් ආදරේ කළා.


ගහක මලක් පිපුණාත්, පුංචි වැහි බිංදුවක් එයාගේ මූණට වැටුනත් , කුරුල්ලෙක් සින්දුවක් කිව්වත් නොරිකෝ ගොඩාක් සතුටු වුණා.


ගොවිපලේ සත්තුත් එක්ක කාලය ගත කරන්න නොරිකෝ ගොඩාක් ආසයි.



ඔන්න ඉතින් එක වළාකුලක්වත් නැති පැහැදිලි නිල් අහසක් තිබුණු ලස්සන දීප්තිමත් දවසක නොරිකෝ එයාගේ බැටලු රංචුවත් එක්ක ඈතින් පෙනෙන පීක් කන්ද නගින්න පටන් ගත්තා.

ලක්ෂ ගණන් වයලට් මල් පිපෙන පීක් කන්ද හරිම ලස්සනයි.





මේ කන්දේ ලුවී කියලා පුංචි නුවණක්කාර මායා කුරු මිට්ටෙක් ජීවත් වෙනවා කියලා හුඟාක් ඈත කාලේ ඉඳලම කතා පැතිරිලා තිබුණා.

නොරිකෝ ගේ සීයා මේ මායාකාර කුරුමිට්ටා ගැන නොරිකෝට ගොඩාක් දේවල් කියලා තිබුණා.


ඉතින් නොරිකෝ නිතරම වැල් ඇඳට වෙලා ඉන්න ගමන් මේ මායාකාර ලුවී ගැන හිතුවා. ලුවී ඇත්තටම ජීවත්වෙන කෙනෙක් කියලා නොරිකෝ විශ්වාස කලා.

නොරිකෝ නිතරම බැටලු රංචුවත් එක්ක පීක් කන්දට යන්න හේතුවත් කවදාම හරි ලුවී එයාට හම්බවෙයි කියලයි.

ඉතින් ඔන්න කන්ද නැගලා දවස පුරාම ගොඩාක් මහන්සි වෙලා බැටළු රංචුව බලාගන්න නිසා දන්නෙම නැතුව ගහක් යට නොරිකෝට ඇස් පියවෙලා ගිහින් හොඳ නින්දකට වැටුණා.

නොරිකෝට කොච්චර තදට නින්ද ගියාද කිව්වොත්, ඉර එයාගේ දිලිසෙන එලිය අඩු කරගෙන මහන්සි අරින අතරේ,

දම්පාට වළාකුළු අස්සෙන් මතුවුන පුංචි තරු කැට දිලිසෙනවා කියලවත් පුංචි නොරිකෝට තේරුනේ නෑ.



බකමූණන්ගේ කෑ ගැසීමෙන් එක පාරටම
එයාගේ තද නින්දෙන් නොරිකෝට
ඇහැරුණා.

ඒ එක්කම නොරිකෝ දැක්කේ තැඹිලිපාටට
ඇවිලෙන ලොකු ගිනි මැලයක්.

ගිනිමැලය අසලම දිග කන් තියෙන රෝස
පාට නහයක් තියෙන තරුකැට වගේ
දිළිසෙන ඇස්  තියෙන පුංචි කුරුමිට්ටෙක්
වාඩිවෙලා ඉන්නවා.

නොරිකෝ හොඳටම බය වුණා.

ටික වෙලාවක් එයා දිහා බලාන් හිටියා.

නොරිකෝට ඒ මොහොතෙම මතක් වුණා
මේ අර මායාකාර ලුවී නේද කියලා.

ඉන්පසු නොරිකෝ බය නැතිව ඇහුවා එයා මායාකාර ලුවී නේද කියලා.

ඔයා මගේ බැටළු රංචුව දැක්ක ද නොරිකෝ ආපසු ඇහුවා.

ඒ ගැන වද වෙන්න එපා පුංචි ගෑණු ළමයෝ එයාල ගෙදර යන්න පාර දන්නවා.

මායාකාර කුරු මිට්ටා කිව්වා.



දැන් හොඳටෝම රෑ වෙලා. මට හොඳටම බයයි. නැන්දයි, මාමයි මාව හොයනවා ඇති. අනේ මට ගෙදර යන්න ඕන, එහෙම කියන ගමන් නොරිකෝ්ට ඇඬෙන්න ආවා.

අනේ ලුවී ඔයාට මායාවක් කරන්න පුළුවන්ද මට ගෙදර යන්න.

මගේ සීයා මට ගොඩක් දේවල් ඔයා ගැන කියලා තියෙනවා. අනේ මම හොඳ ළමයෙක් කාටවත් කරදර කරලා නැහැ. ඒ නිසා මාව ඉක්මණින් ගෙදර යවන්න ඔයාගේ මායාවකින් කියලා පුංචි නොරිකෝ් ලුවීට කිව්වා.

දැන් බයවෙන්න එපා පුංචි ගෑණු ළමයෝ මම ඔයාව ගෙදරටම අරන් යන්නම්. ලුවී නොරිකෝගේ බය නැති කලා.

කරුණාවන්ත හදවතක් තිබෙන, දුකේදී මිනිසුන්ට උදව් වෙන, ඔයා කොයිතරම් හොඳ ළමයෙක් ද. තව කෙනෙක් වෙනුවෙන් කරන පුංචිම පුංචි ක්‍රියාවක වුනත් හැංගිලා තියෙන්නේ කරුණාව. ඒ නිසා ඔයා තමා පුංචි ළමයෝ මේ ගම්මානයේ ජීවත්වන පුංචි මායාකාරිය කියලා ලුවී සතුටින් කීවා.

හරි එහෙනම් පුංචි ගෑණු ළමයෝ මම ඔයාව ගොවිපල ලඟටම ගෙනියන්නම් ලුවී කිව්වා.

දැන් හොඳ ළමයා වගේ මගේ අතින් අල්ලගෙන ඇස් පියා ගන්නකෝ ලුවී කිව්වා.

නොරිකෝට පොඩ්ඩක්වත් බය හිතුණේ නැහැ. එයා ඇස් දෙක පියාගෙන ලුවීගේ අතින් අල්ල ගත්තා.

ටික වෙලාවකින් තමන් පාවෙනවා වගේ නොරිකෝට දැනුනා. නොරිකෝ එහෙමම හිටියා.

හරි දැන් ඇස් අරින්න පුංචි ළමයෝ.

නොරිකෝ ඇස් ඇරියා. හරි පුදුමයි. එයා ගොවිපල ලඟටම ඇවිත් හරිම සතුටුයි.



නැන්දයි මාමයි ගොවිපලේ වැට ළඟටම ඇවිත් හරිම දුකින් නොරිකෝ එනකල් බලාගෙන ඉන්නවා.

ලුවීට ස්තුති කරලා නොරිකෝ නැන්දා ළඟට දුවගෙන ගියා.

නැන්දයි මාමයි සතුටින් නොරිකෝව බදා ගත්තා.

මොකද වුනේ අපේ පුංචි පැටියෝ කියල නැන්දා ඇහුවා.



නොරිකෝ සිදුවුන හැමදේම කිව්වා.

ඉතින් හැමෝම පීක් කන්දේ මායාකාර ලුවීට හදවතින්ම ස්තුති කළා.

නොරිකෝ එදා ඉඳන් තවත් හරිම සතුටින් ජීවත කාලයම ගතකලා තමන්ගේ හීනය සැබෑ වුණ නිසා.

නිමි.

ඔබ යමෙකුට හොඳක් කරන විට ඔබටත් හොඳම දේවල් සිදුවේවි,

එයයි ස්වභාව ධර්මයේ ආශ්චර්ය!



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්